[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 9 ශ්‍රේණිය | විෂයය - නාට්‍ය හා රංගකලාව | පත්‍රය I/II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ..........................................................................................................................................................

**සැලකිය යුතුයි.**

- **1-20** දක්වා ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- **11**කොටසෙහි පළමු ප්‍රශ්නය ඇතුළු ව තෝරා ගත් තවත් ප්‍රශ්න දෙකට පිළිතුරු සපයන්න. මුළු ප්‍රශ්න සංඛ්‍යාව 3 කි.

### I කොටස

- **1-5** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු තෝරා ඉරක් අඳින්න

1) ජනකතාවක දැකිය නොහැකි ලක්ෂණයකි.
   1.ගැඹුරු භාෂාව  2. විවිධ චරිත  3. අනුකරණය  4. කුතුහලය

2) කදා වළලු නාට්‍යයේ අංග රචනය සිදුකර ඇත්තේ,
   1. නාට්‍ය ධර්මීය ශෛලිය ට අනුවය.  2. මිශ්‍ර ශෛලිය අනුව ය.
   3.ලෝක ධර්මීය ශෛලිය ට අනුවය.  4. අමිශ්‍ර ශෛලිය අනුවයි.

3) නාට්‍ය පිටපතක අයත් නොවන්නේ,
   1.තේමාව  2.රූපණය  3. චරිතය  4.සංවාද

4) චරිත අතර ප්‍රතිවිරෝධී අදහස් මතුවීම.
   1. චරිත නිරූපණයයි. 2. සමාරෝපණය යි.  3. ගැටුමයි.  4.තේමාවයි.

5) සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ දයානන්ද ගුණවර්ධනයන් කළ වාර්තා රංගනය ට අයත් සුවිශේෂී නාට්‍ය දෙකකි.
   1.ස්වර්ණතිලක, පරාසය  2. කාමරයේ පොරේ, නරි බෑනා
   3.නරිබෑනා, පරාස  4.මයුර ජවනිකා, ආනන්ද ජවනිකා

6) භාව නිරූපණයට අදාළ වන්නේ,
   1. වාචිකාභිනය.  2. සාත්වික අභිනය  3.ආහාර්ය අභිනය  4. ආංගික අභිනය

7) අභිනය යනුවෙන් අදහස් කරන්නේ,
   1 කාව්‍ය ශාස්ත්‍රයට ට අයත් සංකල්පයකි.  2.වේෂභූෂණයට යුක්ත වීමකි.
   3. ඉදිරියට පැමිණ වීමයි.  4. පිටපත රචනා කිරීමයි.

8) පහත නාට්‍ය අතරින් ලෝක ධර්මීය නාට්‍ය ඇතුළත් පිළිතුරු වන්නේ,
   1.කැලණි පාලම, තට්ටු ගෙවල්  2. කැලණි පාලම, මනමේ
   3.තට්ටු ගෙවල්, කදා වළලු  4. කදාවළලු, මනමේ

9) කදාවළලු නාට්‍ය අංග රචනය සිදුකර ඇත්තේ,

1.නාට්‍ය ධර්මිය ශෛලිය ට අනුව 2. ලෝක ධර්මිය ශෛලිය ට අනුව

3. දමිළ ශෛලිය ට අනුව 4. මිශ්‍ර ශෛලිය ට අනුව

10) නාට්‍යක සිදුවීම් පෙළගස්වා ඇති අයුරු හඳුන්වන්නේ,

1. කතා වින්‍යාසය. 2.පරිකල්පනය 3.සමාරෝපණය 4. ශෛලිය

- **11 – 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා ලියන්න.**

11) ඇස් අතර සම්බන්ධතාවය පවත්වා ගැනීමට__________ වැදගත් වේ.

12) මනස මූලික හටගන්නා භාවයන් ශාරීරික වශයෙන් ප්‍රකට කරවීම ____________ වේ.

13) නළුවා බාහිරව හා අභ්‍යන්තරික ව චරිතය බවට පත්වීම ____________ වේ.

14) නාට්‍ය සංදර්ශනයකදී චරිතයක දැකිය හැකි විවිධ පැතිකඩ _____________ නමින් හඳුන්වයි.

15) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යයක් වනුයේ ____________ ය.

( සමාරෝපය, භූමිකා, සාත්වික අභිනය, දර්පණ තල අභ්‍යාස, මනමේ, නරිබෑනා)

- **15-20 ප්‍රශ්නවලට දී ඇති රූප සටහන් භාවිත කරමින් පිළිතුර තෝරන්න.**



A B C D E

16) නරිබෑනා නාට්‍ය නිර්මාණය කළ නාට්‍ය කරුවා වන්නේ,

1.A. 2.B. 3.C. 4.D

17) C ඡායාරූපයේ සිටින නාට්‍යය නිර්මාණකරුවා වන්නේ,

1. දයානන්ද ගුණවර්ධන 2. එදිරිවීර සරච්චන්ද්‍ර

3. ගුණසේන ගලප්පත්ති 4.හෙන්රි ජයසේන

18) පුංචි අපට තේරේ නාට්‍ය නිර්මාතෘ වන්නේ,

1.සෝමලතා සුබසිංහ 2.මාලනී රණසිංහ 3. රත්නාලාලනී 4. ත්‍රිලීෂියා ගුණවර්ධන

19) D අක්ෂරයෙන් දැක්වෙන රංගන ශිල්පියා වන්නේ,

1. සිරිල් වික්‍රමගේ 2. නිශ්ශංක දිද්දෙණිය 3. ශ්‍රියන්ත මෙන්ඩිස් 4.ජැක්සන් ඇන්තනි

20) කදාවළලු නාට්‍ය නිර්මාණකරුවකු අයත් වන ඡායාරූපය වන්නේ,

1.A. 2. B. 3. C. 4. D

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

**1.** 1. කදා වළලු නාට්‍යයේ පාදක කරගත් ජාතක කතාව නම් කරන්න.

2. මෙම නාට්‍ය අයත් වන ශෛලිය කුමක් ද?

3. කදා වළලු නාට්‍ය රචකයා නම් කරන්න.

4. දුෂ්ට ගති ඇති වෙළෙන්දා නම් කර ඔහුගේ දුෂ්ටතාවය මතු කරන අවස්ථාවක් දක්වන්න.

5. මෙම නාට්‍ය තේමාව කුමක්ද?

2. 1. සමාජයේ දැකගත හැකි විවිධ චරිත හතරක් දක්වන්න.

2. ඉන් එක් චරිතයක විවිධ භූමිකා රූප සටහන් මගින් දක්වන්න.

3. චරිතයක විවිධ භූමිකා නිරූපණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු පහක් ලියන්න.

3. 1. බෞද්ධ පූජා කර්ම තුනක් නම් කරන්න.

2. බෞද්ධ පූජා කර්ම බිහිවීමට හේතු වූ ඓතිහාසික පසුබිම සඳහන් කරන්න.

3. ඔබ දැක ඇති බෞද්ධ පූජා කර්මයක නාට්‍යමය ලක්ෂණ පිළිබඳව පහදන්න.

4. 1. නාට්‍ය නිර්මාණය කිරීමේදී භාවිත කරන අනුෂාංගික කලා තුනක් නම් කරන්න.

2. අනුශාංගික අංග සැලසුම් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු තුනක් ලියන්න.

3. ඔබ විසින් ඇරඹූ නාට්‍ය අනුශාංගික අංග භාවිතා කර ඇති ආකාරය පිළිබඳ නිදසුන් දෙමින් විස්තර කරන්න.

# 9 ශ්‍රේණිය - නාට්‍ය හා රංග කලාව

9 වසර

පිළිතුරු පත්‍රය

| | | |
|---|---|---|
| 1. | 1. | 6.11 |
| 2. | 1. | 7.111 |
| 3. | 11. | 8. 1 |
| 4. | 111. | 9. 1 |
| 5. | 11. | 10. 1 |

| | |
|---|---|
| 11.දර්පණ තල | 16.11 |
| 12. සාත්වික අභිනය | 17. 11 |
| 13. සමාරෝපය | 18. 1 |
| 14. භූමිකා | 19. 11 |
| 15. මනමේ | 20.1 |

11 කොටස

1) 1.සේරිවාණිජ ජාතකය
2. නාට්‍යධර්මි ශෛලිය
3.එදිරිවීර සරච්චන්ද්‍ර
4. දුෂ්ට ගති පැවතුම් ඇති අවස්ථාවක් ලියා ඇත්නම් ලකුණු දෙන්න
5. තේමා පැහැදිලිව ලියා ඇත්නම් ලකුණු දෙන්න

2) 1.ඕනෑම චරිතයක්
2.භූමිකා වගුව ඇඳ ඇත්නම් ලකුණු දෙන්න
3.තේමාව ,යුගය, ශෛලිය ආදී වශයෙන් කරුණු වශයෙන් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

3) 1.සුවිසි විවරණය, දොරකඩ අස්න, ආලවක දමනය
2 කරුණු ලියා ඇත්නම් ලකුණු දෙන්න
3.නාට්‍යමය ලක්ෂණ ඇතුළත් අංග ලියා ඇත්නම් ලකුණු දෙන්න

4) 1. සංගීතය ,චිත්‍ර ,නර්තනය
2. කරුණු ලියා ඇත්නම් ලකුණු දෙන්න
3.නිදසුන් සහිතව ලියා ඇත්නම් ලකුණු දෙන්න


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න